'සැ. යු. — 2012.06.15 දින පළ වූ අංක 1,763 දරන ගැසට් පත්‍රයේ I-III කොටස පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,764- 2012 ජූනි මස 22 වැනි සිකුරාදා - 2012.06.22

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## IV (අ) වැනි කොටස - පළාත් සභා

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිටුව |
|---|---|
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය ... ... | — |
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... ... | 1094 |
| වෙනත් පත්කිරීම් ... ... ... ... | — |
| පළාත් සභා නිවේදන ... ... ... ... | — |
| පළාත් සභා විවිධ දැන්වීම් ... ... ... ... | — |
| තනතුරු ඇබෑර්තු ... ... ... ... | — |
| විභාග විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | 1096 |
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... ... | — |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

**වැදගත් නිවේදනයයි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2012 ජූනි මස 29 වැනි දින පළ කරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2012 ජූනි මස 15 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**ලක්ෂමන් ගුණවර්ධන,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2012 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

# ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද පත් කිරීම් ආදිය

**1987 අංක 42 දරන පළාත් සභා පනතේ IV වැනි කොටසේ 32 (1) වගන්තිය යටතේ වයඹ පළාත් ගරු ආණ්ඩුකාරතුමා විසින් කරන ලද පත්වීම්**

| *අනු. අංකය* | *නම/සේවය/පන්තිය* | *පත්කරන ලද තනතුර/කාර්යාලය ක්‍රියාත්මක වන දිනය* |
|---|---|---|
| 01 | ආර්. එම්. ඩබ්. එස්. සමරදිවාකර මහතා ශ්‍රී. ලං. ප. සේ. I පංතිය | 2012.01.05 දිනැති ලිපියෙන් වහාම ක්‍රියාත්මක වන පරිදි, වයඹ පුහුණු ආයතනයේ, අධ්‍යක්ෂ තනතුර සඳහා |
| 02 | පී. ජේ. ආර්. ඒ. ඩබ්. සී. රණසිංහ මහතා ශ්‍රී. ලං. ප. සේ. I පංතිය | 2012.01.04 දිනැති ලිපියෙන් වහාම ක්‍රියාත්මක වන පරිදි, වයඹ පළාත් සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය සමුපකාර සංවර්ධන කොමසාරිස් තනතුර සඳහා |
| 03 | පී. ඩී. එස්. කේ. ගුණපාල මෙනවිය ශ්‍රී. ලං. ප. සේ. III පංතිය | 2012.01.06 දිනැති ලිපියෙන් වහාම ක්‍රියාත්මක වන පරිදි, වයඹ ප්‍රධාන ලේකම් කාර්යාලයේ, සහකාර ප්‍රධාන ලේකම් (පුහුණු) තනතුර සඳහා |
| 04 | එච්. එම්. ඩී. එස්. විජේරත්න මෙනවිය ශ්‍රී. ලං. ප. සේ. III පංතිය | 2012.01.04 දිනැති ලිපියෙන් වහාම ක්‍රියාත්මක වන පරිදි, වයඹ පළාත් පාලන දෙපාර්තමේන්තුවේ, සහකාර පළාත් පාලන කොමසාරිස් තනතුර සඳහා |
| 05 | එච්. එස්. සී. එල්. සඳරත්න මෙනවිය ශ්‍රී. ලං. ප. සේ. III පංතිය | 2012.01.04 දිනැති ලිපියෙන් වහාම ක්‍රියාත්මක වන පරිදි, වයඹ පළාත් කෘෂිකර්ම, සත්ව නිෂ්පාදන සහ සංවර්ධන, සුළු වාරිමාර්ග සහ ගොවිජන සංවර්ධන අමාත්‍යාංශයේ සහකාර ලේකම් තනතුර සඳහා |
| 06 | එම්. ඒ. එම්. පියසේන මිය ශ්‍රී. ලං. ප. සේ. III පංතිය | 2012.01.04 දිනැති ලිපියෙන් වහාම ක්‍රියාත්මක වන පරිදි, වයඹ පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ, සහකාර ලේකම් තනතුර සඳහා |
| 07 | ඩබ්. එම්. එන්. පී. බුද්ධදාස මිය ශ්‍රී. ලං. ප. සේ. III පංතිය | 2012.01.06 දිනැති ලිපියෙන් වහාම ක්‍රියාත්මක වන පරිදි, වයඹ ප්‍රධාන ලේකම් කාර්යාලයේ, සහකාර ප්‍රධාන ලේකම් (ආයතන) ශ්‍රී ලංකා පරිපාලන සේවයේ II පංතියේ තනතුරේ පූර්ණකාලීනව වැඩබැලීම සඳහා |
| 08 | ජී. ජී. ඩී. ගුණසිංහ මිය ශ්‍රී. ලං. ප. සේ. III පංතිය | 2012.01.06 දිනැති ලිපියෙන් වහාම ක්‍රියාත්මක වන පරිදි, වයඹ ප්‍රධාන ලේකම් කාර්යාලයේ, සහකාර ප්‍රධාන ලේකම් (ආයතන) තනතුර සඳහා |
| 09 | නිලූකා කේ. ජයවර්ධන මිය ශ්‍රී. ලං. ප. සේ. III පංතිය | 2012.01.04 දිනැති ලිපියෙන් වහාම ක්‍රියාත්මක වන පරිදි, වයඹ පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ සහකාර පළාත් ඉඩම් කොමසාරිස් තනතුර සඳහා |
| 10 | ටී. බී. වික්‍රමසිංහ මහතා ශ්‍රී. ලං. ප. සේ. I පංතිය | 2012.01.12 දින සිට ක්‍රියාත්මක වන පරිදි, වයඹ පළාත් පේෂකර්ම දෙපාර්තමේන්තුවේ පළාත් අධ්‍යක්ෂ තනතුර සඳහා |
| 11 | ආර්. එම්. එස්. එච්. රාජපක්ෂ මිය ශ්‍රී. ලං. ප. සේ. III පංතිය | 2012.01.23 දිනැති ලිපියෙන් වහාම ක්‍රියාත්මක වන පරිදි, වයඹ පළාත් ආණ්ඩුකාරවර කාර්යාලයේ, සහකාර ලේකම් තනතුර සඳහා |
| 12 | ටී. බී. වික්‍රමසිංහ මහතා ශ්‍රී. ලං. ප. සේ. I පංතිය | 2012.02.03 දිනැති ලිපියෙන් වහාම ක්‍රියාත්මක වන පරිදි, වයඹ පළාත් පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ පළාත් කොමසාරිස් තනතුර සඳහා |
| 13 | එම්. එච්. එම්. රියාල්දීන් මහතා ශ්‍රී. ලං. ප. සේ. I පංතිය | 2012.02.03 දිනැති ලිපියෙන් වහාම ක්‍රියාත්මක වන පරිදි, වයඹ පළාත් පේෂකර්මාන්ත දෙපාර්තමේන්තුවේ පළාත් අධ්‍යක්ෂ තනතුර සඳහා |
| 14 | නිලූකා කේ. ජයවර්ධන මිය ශ්‍රී. ලං. ප. සේ. III පංතිය | 2012.03.29 දිනැති ලිපියෙන් වහාම ක්‍රියාත්මක වන පරිදි, වයඹ පළාත් සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශයේ, සහකාර ලේකම් (ශ්‍රී. ලං. ප. සේ. II පංතිය) තනතුරෙහි පූර්ණකාලීනව වැඩ බැලීම සඳහා |

| අනු අංකය | නම/සේවය/පන්තිය | පත්කරන ලද තනතුර/කාර්යාලය ක්‍රියාත්මක වන දිනය |
|---|---|---|
| 15 | ඩී. එම්. ඒ. එච්. එම්. ඩී. ඩී. උකුවෙල මෙනවිය ශ්‍රී. ලං. ප. සේ. III පංතිය | 2012.03.29 දිනැති ලිපියෙන් වහාම ක්‍රියාත්මක වන පරිදි, පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ සහකාර පළාත් ඉඩම් කොමසාරිස් තනතුර සඳහා |
| 16 | බී. එම්. යූ. සරත් කුමාර මහතා ශ්‍රී. ලං. ග. සේ. III පංතිය | 2011.12.13 දිනැති ලිපියෙන් වහාම ක්‍රියාත්මක වන පරිදි, වයඹ පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ගණකාධිකාරී තනතුරේ වැඩ බැලීම සඳහා |
| 17 | ඒ. එම්. පී. අලහකෝන් මහතා ශ්‍රී. ලං. ග. සේ. II පංතිය | 2012.02.13 දිනැති ලිපියෙන් වහාම ක්‍රියාත්මක වන පරිදි, වයඹ පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයේ, ගණකාධිකාරී තනතුර සඳහා |
| 18 | ඩබ්. ඒ. පී. වයි. විජේසිංහ මහතා ශ්‍රී. ලං. ග. සේ. III පංතිය | 2012.02.13 දිනැති ලිපියෙන් වහාම ක්‍රියාත්මක වන පරිදි, දින දෙකක් කුලියාපිටිය රෝහලේ රාජකාරි ආවරණය කිරීමට යටත්ව, මාදම්පේ දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයේ ගණකාධිකාරී තනතුර සඳහා |
| 19 | ඩී. එම්. කේ. දසනායක මහතා ශ්‍රී. ලං. ග. සේ. II පංතිය | 2012.03.29 දිනැති ලිපියෙන් වහාම ක්‍රියාත්මක වන පරිදි, ඔබගේ නිත්‍ය තනතුරට අමතරව වයඹ පළාත් මාර්ග සංවර්ධන, විදුලිබල, නිවාස හා ඉදිකිරීම් සහ ධීවර කටයුතු අමාත්‍යාංශයේ ගණකාධිකාරී තනතුරේ වැඩ බැලීම සඳහා |
| 20 | ඩබ්. එම්. ආර්. සී. කුමාරි මිය ශ්‍රී. ලං. ග. සේ. II පංතිය | 2012.04.10 දිනැති ලිපියෙන් වහාම ක්‍රියාත්මක වන පරිදි, කුරුණෑගල මහ නගර සභාවේ ගණකාධිකාරී තනතුර සඳහා |
| 21 | එල්. එච්. එම්. ජිනාදරී මිය ශ්‍රී. ලං. කෘ. සේ. II/II පංතිය | 2012.03.01 දිනැති ලිපියෙන් වහාම ක්‍රියාත්මක වන පරිදි, දඹදෙණිය කලාපීය සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ කාර්යාලයේ සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ තනතුර සඳහා |
| 22 | ජී. පී. මහවිතානගේ මිය ශ්‍රී. ලං. කෘ. සේ. II/II පංතිය | 2012.03.01 දිනැති ලිපියෙන් වහාම ක්‍රියාත්මක වන පරිදි, මාදම්පේ කලාපීය සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ කාර්යාලයේ, සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ තනතුර සඳහා |
| 23 | ජී. එම්. එන්. තිලකරත්න මහතා ශ්‍රී. ලං. සනි. සේ. I පංතිය | 2010.01.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි, වයඹ පළාත් සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ, විෂයානුබද්ධ විශේෂඥ තනතුර සඳහා |
| 24 | එච්. එම්. ඒ. බී. හේරත් මහතා ශ්‍රී. ලං. අ. ප. සේ. III පංතිය | 2011.05.11 දිනැති ලිපියෙන් වහාම ක්‍රියාත්මක වන පරිදි, ගිරිඋල්ල අධ්‍යාපන කාර්යාලයේ, සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ (සංවර්ධන) තනතුර සඳහා |
| 25 | ඩී. ජී. ඥානමාලි දිවියාගහගෙදර මිය ශ්‍රී. ලං. අ. ප. සේ. III පංතිය | 2011.05.31 දිනැති ලිපියෙන් වහාම ක්‍රියාත්මක වන පරිදි, ඉබ්බාගමුව කලාප අධ්‍යාපන කාර්යාලයේ සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ තනතුර සඳහා |
| 26 | ඒ. ආර්. පී. ජයතිලක මහතා ශ්‍රී. ලං. අ. ප. සේ. III පංතිය | 2012.02.23 දිනැති ලිපියෙන් වහාම ක්‍රියාත්මක වන පරිදි, කුරුණෑගල කලාප අධ්‍යාපන කාර්යාලයේ සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ (අධ්‍යාපන පරිපාලන) තනතුර සඳහා |
| 27 | ජේ. එම්. ටිකිරිබණ්ඩා මහතා ශ්‍රී. ලං. අ. ප. සේ. III පංතිය | 2012.02.23 දිනැති ලිපියෙන් වහාම ක්‍රියාත්මක වන පරිදි, මාවතගම කොට්ඨාස අධ්‍යාපන කාර්යාලයේ, කොට්ඨාස අධ්‍යාපන අධ්‍යක්ෂ තනතුර සඳහා |

ගරු ආණ්ඩුකාරතුමාගේ නියමය පරිදි,

එන්. පී. එම්. කාරියවසම්,
වයඹ ආණ්ඩුකාරවර ලේකම්.

2012 මැයි මස,
වයඹ ආණ්ඩුකාරවර කාර්යාලයේ දී ය.

06-649

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

## උතුරු මැද පළාත් රාජ්‍ය සේවයේ ග්‍රාම සංවර්ධන නිලධාරි (II වැනි පන්තිය) තනතුර සඳහා බඳවා ගැනීමේ සීමිත තරග විභාගය - 2011 (2012)

උතුරු මැද පළාත් රාජ්‍ය සේවයේ ග්‍රාම සංවර්ධන නිලධාරීන් බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටියට අනුව බඳවා ගන්නා දිනට බඳවා ගැනීමට අනුමත වී ඇති පුරප්පාඩු 08ක් හෝ ආසන්න සංඛ්‍යාවක් සම්පූර්ණ කිරීම සඳහා උතුරු මැද පළාත තුළ පදිංචි පළාත් රාජ්‍ය සේවයේ නියුතු පහත සුදුසුකම් ඇති අයගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

01. *තනතුරට අදාළ වැටුප් පරිමාණය.-*

MN 5-2006A මාසික වැටුප රු. 16,720 -11 x 320 - 11 x 365 - 15 x 450 -30,685 වේ. මෙම වැටුප් පරිමාණයේ තුන්වැනි වැටුප් පියවරට පෙර එනම් රු. 17,680 ට පෙර පළමු කාර්යක්ෂමතා කඩඉම ද හත්වන වැටුප් පියවරට පෙර එනම් රු. 18,960 ට පෙර දෙවැනි කාර්යක්ෂමතා කඩඉම ද වේ.

02. *සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි.-*

මෙම තනතුර ස්ථිර ය. විශ්‍රාම වැටුප් සහිතය. ආයතන සංග්‍රහයේ II පරිච්ඡේදයේ 10-12 දක්වා වූ ඡේද අදාළ වේ.

රාජ්‍ය සේවයේ නියුතු ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත නිලධාරියෙකු තෝරාගත හොත් ඔහුගේ පත්වීම එක් අවුරුදු වැඩ බැලීමේ පරීක්ෂණ කාලයකට යටත් වේ. රාජ්‍ය සේවයේ නියුතු පරිවාස කාලය තුළ සිටින නිලධාරියෙකු නම් වසර 03 ක පරිවාස කාලයකට යටත්විය යුතු ය.

මෙම තනතුරට අදාළ උතුරු මැද පළාත් රාජ්‍ය සේවයේ ග්‍රාම සංවර්ධන නිලධාරීන් බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටියේ ඇතුළත් රෙගුලාසිවලට අමතරව, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ රෙගුලාසිවලට ද, මුදල් රෙගුලාසිවලට ද, දෙපාර්තමේන්තු නියෝගවලට ද තනතුරට අදාළ ව්‍යවස්ථාවලට ද, රජයේ හෝ උතුරු මැද පළාත් සභාව විසින් නිකුත් කර ඇති හා වරින් වර නිකුත් කරනු ලබන වෙනත් රෙගුලාසිවලට හා නියෝගවලට ද අනුකූලව ක්‍රියා කිරීමට මෙම තනතුරට බඳවා ගනු ලබන සියලුම නිලධාරීන් බැඳී සිටිය යුතු ය.

බඳවා ගනු ලබන නිලධාරීන් උතුරු මැද පළාත් සභා බල ප්‍රදේශයේ කවර ප්‍රදේශයක වුව ද අනිවාර්ය අවුරුදු 05 ක කාලයක් සේවය කිරීමට බැඳී සිටිය යුතු අතර අභ්‍යන්තර ස්ථානමාරුවීම් වලට යටත් විය යුතු ය.

03. *අවශ්‍ය සුදුසුකම් :-*

*අධ්‍යාපන සුදුසුකම් :*

(*අ*) පිළිගත් විශ්වවිද්‍යාලයක උපාධියක් තිබීම ;

*හෝ*

(*ආ*) අ. පො. ස. (උසස් පෙළ) විභාගයෙන් එකම අවස්ථාවක දී විෂයයන් හතරකින් (04) හෝ අ. පො. ස. (උසස් පෙළ) නව නිර්දේශ යටතේ විෂයයන් තුනකින් (03) එකවර සමාර්ථය ලබා තිබීම සහ ශ්‍රී ලංකා සමාජ සේවා විද්‍යාලයේ සමාජ වැඩ පිළිබඳ දෑ අවුරුදු ඩිප්ලෝමා සහතිකය හෝ ශ්‍රී ලංකා විශ්ව විද්‍යාලයේ ප්‍රජා සංවර්ධනය පිළිබඳ ඩිප්ලෝමා සහතිකය හෝ කෘෂිකර්ම අභ්‍යාස විද්‍යාලයේ කෘෂිකර්ම ඩිප්ලෝමා සහතිකය හෝ ලබා තිබීම ;

*හෝ*

(*ඇ*) අ. පො. ස. (උසස් පෙළ) විභාගයෙන් එකම අවස්ථාවක දී විෂයයන් හතරකින් (04) හෝ අ. පො. ස. (උසස් පෙළ) නව නිර්දේශය යටතේ විෂයයන් තුනකින් (03) එකවර සමත්වීමෙන් අනතුරුව රජයේ නිලධාරියෙකු වශයෙන් හෝ රාජ්‍ය සංස්ථාවක නිලධාරියෙකු වශයෙන් හෝ යටත් පිරිසෙයින් අවුරුදු 07 ක අඛණ්ඩ පළපුරුද්දක් ලබා තිබීම ;

*හෝ*

(*ඈ*) (i) විෂයයන් හතරකට සම්මාන සාමාර්ථ සහිතව ජ්‍යෙෂ්ඨ පාඨමාලා සහතික පත්‍ර විභාගයෙන් ;

*හෝ*

(ii) විෂයයන් හතරකට සම්මාන සාමාර්ථයන් සහිතව සිංහල/දෙමළ භාෂාව සහ අංක ගණිත/ගණිතය/ව්‍යවහාරික ගණිතය/වාණිජ ගණිතය යන විෂයයන් දෙකක් ද සහිතව එක් වරකට විෂයයන් 05ක් ඇතුළුව දෙවරකට නොවැඩි වාර ගණනක දී විෂයයන් 06 ක් අ. පො. ස. (සාමාන්‍ය පෙළ) විභාගයෙන්/ජාතික පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයෙන් සමත් වීමෙන් අනතුරුව රජයේ නිලධාරියෙකු හෝ සංස්ථාවක නිලධාරියෙකු වශයෙන් යටත් පිරිසෙයින් අවුරුදු 10 ක අඛණ්ඩ පළපුරුද්දක් ලබා තිබීම.

*පොදු සුදුසුකම්.-*

(i) විශිෂ්ට චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍යයෙන් යුක්ත විය යුතු ය.
(ii) බඳවාගනු ලබන අයවලුන් රජයේ සේවයේ නියුක්ත අය බැවින් වයස් සීමාව බල නොපැවැත් වේ.
(iii) ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතු ය.
(iv) උතුරු මැද පළාත් සභා බල ප්‍රදේශය තුළ පදිංචිකරුවෙකු විය යුතු ය.

04. *අයදුම් කළ යුතු පිළිවෙළ.-*

(*අ*) මෙම නිවේදනයේ අගට යොදා ඇති ආදර්ශ අයදුම් පත්‍රය අනුව ඒ 4 ප්‍රමාණයේ කඩදාසියක දෙපැත්තම ප්‍රයෝජනයට ගනිමින් අයදුම්පත්‍රය තමන් විසින්ම සකස් කරගත යුතු ය. අංක 01 සිට 09 තෙක් කොටස් පළමු පිටුවේ ද අංක 10 සිට 11 තෙක් කොටස් දෙවන පිටුවේ ද ඉතිරිය තුන්වන පිටුවට ද ඇතුළත් වන සේ අයදුම් පත්‍රය සැකසිය යුතු ය.

(*ආ*) නිවැරදිව සම්පූර්ණ කරන ලද හා නිර්දේශ කරන ලද අයදුම්පත් 2012.07.23 වැනි දින හෝ ඊට පෙර "ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, උතුරු මැද පළාත, අනුරාධපුර" යන ලිපිනයට ලැබෙන පරිදි ඔබ සේවය කරන දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහ අමාත්‍යාංශ ලේකම්ගේ නිර්දේශ සහිතව ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. අයදුම්පත්‍රය බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ "ග්‍රාම සංවර්ධන නිලධාරි (ii වැනි පන්තිය) තනතුර සඳහා බඳවා ගැනීමේ සීමිත තරග විභාගය - 2011 (2012)" ලෙස සටහන් කර තිබිය යුතු ය.

(*ඇ*) ඉල්ලුම්පත්‍ර සකස් කිරීමේ දී ඊට අදාළ තොරතුරු තම අත් අකුරින් ම පැහැදිලිව ඇතුළත් කළ යුතු අතර, ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල

නොවන අසම්පූර්ණ සහ නිවැරදිව තොරතුරු සඳහන් කර නොමැති අයදුම්පත්‍රත් ප්‍රමාද වී එවන හා නියමිත දිනට ඉදිරිපත් නොකරන හා ලියා පදිංචි තැපැල මගින් එවා නොමැති අයදුම්පත්‍රත් කිසිදු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත් තැපැලේ දී නැතිවීම හා ප්‍රමාද වීම පිළිබඳව කෙරෙන කිසිදු පැමිණිල්ලක් සළකා බලනු නොලැබේ. ඉදිරිපත් කරන ලද අයදුම්පත්‍රයේ ඡායා පිටපත් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

05. *බඳවා ගැනීමේ ක්‍රමය.-*

(i) මේ සඳහා පවත්වනු ලබන තරඟ විභාගය සිංහල/දෙමළ මාධ්‍යවලින් පවත්වනු ලැබේ. අයදුම්පත්‍ර සකස්කල යුත්තේ තමා විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යයෙනි. ඉල්ලුම් කරන මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

(ii) විභාගය අනුරාධපුරදී පමණක් පවත්වනු ලැබේ.

(iii) *අභියෝග්‍යතාව* - කාලය පැය 01 යි ලකුණු 100 යි. සමත් ලකුණු 40% (මෙම ප්‍රශ්න පත්‍රයෙන් අපේක්ෂකයන්ගේ සංඛ්‍යාමය හැකියාව, තර්කන ශක්තිය, සාමාන්‍ය බුද්ධිය මැනීමට අදහස් කෙරේ.) බහුවරණ කෙටි පිළිතුරු මාදිලියේ ප්‍රශ්නවලින් සමන්විතය. සියලු ප්‍රශ්නවලට පිළිතුරු සැපයිය යුතුය. ලිඛිත ප්‍රශ්න පත්‍රයට ලකුණු 40ට වඩා ලබා ගන්නා අපේක්ෂකයින්ගේ ප්‍රමුඛතාවය අනුව බඳවා ගැනීම සිදු කෙරේ.

(iv) පළාත් ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුවේ ග්‍රාම සංවර්ධන නිලධාරී තනතුරක රාජකාරී ඉටුකර ඇති බවට, ඉදිරිපත් වූ අයදුම්කරුවන්ගේ පෞද්ගලික ලිපිගොනු, කොමිෂන් සභාව විසින් පත් කරනු ලබන කමිටුවක් මගින් පරීක්ෂා කර තහවුරු කර ගැනීමෙන් පසුව එම සේවා කාලයට එක් වසරකට ලකුණු 01 බැගින් උපරිම ලකුණු 10ක් ලබා දෙනු ඇත.

(v) මෙම විභාගය ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් හෝ උතුරු මැද පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව මගින් පවත්වනු ලැබේ. ඒ අනුව ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ලැබේ.

(vi) අයදුම්කරුවන් වෙත ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් පුවත්පත් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පළ කරනු ඇත. නිවේදනය පළ වී දින 2ක් හෝ 3ක් ගත වූ පසුවත් ප්‍රවේශ පත්‍රය නොලැබුණි නම් දැන්වීමේ සඳහන් ආකාරයට ඒ බව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දන්වා සිටිය යුතුයි. ඔබ වෙත තබාගත් අයදුම්පත්‍රයේ හා මුදල් ගෙවූ කුවිතාන්සියේ සහතික කළ ඡායා පිටපත් ද, ලියාපදිංචි කළ කුවිතාන්සිය ද, කොළඹින් බැහැර ප්‍රදේශයක නම් ප්‍රවේශපත්‍රය එවීම සඳහා ෆැක්ස් අංකයක් ද සඳහන් ඔබගේ ඉල්ලීම් ලිපිය ද ළඟ තබාගෙන ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දැන්වීම වඩාත් ඵලදායී වනු ඇත.

(vii) මෙම විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් ඉහත විභාග බලධාරියා විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අපේක්ෂකයින් යටත් වේ. එකී නීතිරීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල්ගේ තීරණය අවසාන තීරණය වන අතර, උතුරු මැද පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පනවනු ලබන දඬුවමකට යටත්වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇත.

(viii) විභාගයේ විභාග අපේක්ෂකයින්ගේ අනන්‍යතාවය තහවුරු කිරීම සඳහා පිළිගනු ලබන්නේ පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවෙන් නිකුත් කළ ජාතික හැඳුනුම්පත හෝ වලංගු විදේශ ගමන් බලපත්‍රය හෝ පමණි.

(ix) විභාගය ආරම්භ වන දිනයේ විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වන්නේ තම අත්සන සහතික කරවාගත් ප්‍රවේශ පත්‍රය පමණි.

(x) අපේක්ෂකයෙකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතු ය.

06. *විභාග ගාස්තු.-* විභාග ගාස්තුව වශයෙන් රු. 250/- ක් ගෙවිය යුතුය. විභාග ගාස්තු වශයෙන් මුද්දර හෝ මුදල් ඇණවුම් නොඇලවිය යුතු අතර, උතුරු මැද පළාත තුළ පිහිටා ඇති ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට මුදල් ගෙවා ඒ සඳහා නිකුත් කරන NC 100 කුවිතාන්සියක් අයදුම්පත්‍රයට අලවා එවිය යුතුය. මෙම විභාග ගාස්තු කිසිදු හේතුවක් මත ආපසු ගෙවනු නොලැබේ. කුවිතාන්සියේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

07. *පොදු කරුණු.-*

(i) මෙම විභාගයේ නීතිරීති අනුව යම් අපේක්ෂකයෙකු නුසුදුසු බව අනාවරණය වුවහොත් විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙන අතරතුර හෝ විභාගයෙන් පසුව හෝ තෝරා ගැනීමෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක ඔහුගේ/ඇයගේ අපෙක්ෂකත්වය අවලංගු කළ හැකිය.

(ii) එසේම තෝරාගත් පත්වීම් ලද අයෙකු විසින් ඉදිරිපත් කරන ලද තොරතුරක් ඕනෑම අවස්ථාවක අසත්‍ය බව පෙනී ගියහොත් හෝ ඔහු/ඇය රජයේ සේවයෙන් පහ කිරීමට පිළිවන.

08. *තෝරා ගැනීමේ ක්‍රමය.-*

(i) ඉහත ලිඛිත තරඟ විභාගයෙන් සමත්වීම සඳහා ලකුණු 40% ක් හෝ ඊට වැඩියෙන් ලකුණු ලබාගත යුතු අතර, ලකුණු ප්‍රමුඛතාවය තීරණය කිරීමේ දී එම ලකුණුවලට නිවේදනයේ 5.iv හි විධිවිධාන අනුව ලබාදෙන ලකුණු ද එකතු කර ලබන ලකුණු ප්‍රමුඛතාවය මත රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 15/90 හි සඳහන් විධිවිධාන අනුගමනය කර සම්මුඛ පරීක්ෂණයකට කැඳවන අතර සම්මුඛ පරීක්ෂණයේ දී ලකුණු දීමක් සිදු නොවේ. එය සුදුසුකම් සනාථ කර ගැනීමක් සඳහා සහ ශාරීරික යෝග්‍යතාවය මැන බැලීම සඳහා පමණක් පැවැත්වේ.

(ii) මෙම බඳවා ගැනීම සම්බන්ධ සියලු කටයුතු උතුරු මැද පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය පරිදි වනු ඇත.

එස්. එම්. එස්. තෙන්නකෝන්,
ලේකම්,
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
උතුරු මැද පළාත.

2012 ජුනි මස 01 වැනි දින.

ආදර්ශ අයදුම් පත්‍රය

**උතුරු මැද පළාත් රාජ්‍ය සේවයේ ග්‍රාම සංවර්ධන නිලධාරී (II වැනි පන්තිය) තනතුර සඳහා බඳවා ගැනීමේ සීමිත තරඟ විභාගය - 2011 (2012)**

Limited Competitive Examination for recruitment to the Post of Rural Development Officer (Class II) in the North Central Provincial Public Service - 2011 (2012)

(කාර්යාලීය ප්‍රයෝජනය සඳහා පමණි)

විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය :

(අදාළ අංකය කොටුව තුළ ලියන්න)
සිංහල - 1
දෙමළ - 2

01 මුලකුරු අගට යොදා මුලකුරු සමග නම :————.
(සිංහලෙන්/දෙමළෙන්)

02 මුලකුරු අගට යොදා මුලකුරු සමග නම :————.
(ඉංග්‍රීසියෙන්) උදා :- SUNIL, A. B.

03 සම්පූර්ණ නම :————.
(සිංහලෙන්/දෙමළෙන්)

04 සම්පූර්ණ නම :————.
(ඉංග්‍රීසියෙන්)

05 ජාතික හැඳුනුම්පත් අංකය :

06 ස්ථිර ලිපිනය :

(i) සිංහලෙන්/දෙමළෙන් :————.
(ii) ඉංග්‍රීසියෙන් :————.
(iii) දුරකථන අංකය :————.

07 ස්ථිර පදිංචිය :

(i) පදිංචි දිස්ත්‍රික්කය :————.
(ii) ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය :————.
(iii) ග්‍රාම නිලධාරී කොට්ඨාසය :————.

08 ස්ත්‍රී/පුරුෂ භාවය :

අදාල අංකය කොටුව තුළ ලියන්න.
පුරුෂ - 0
ස්ත්‍රී - 1

09 උපන් දිනය : වර්ෂය : මාසය : දිනය :

10. අධ්‍යාපන සුදුසුකම් :

(i) උපාධිය පිළිබඳ විස්තර :

(අ) ලබා ඇති උපාධිය :————.
(ආ) විශ්ව විද්‍යාලය :————.
(ඇ) උපාධිය වලංගු වන දිනය :————.

(ii) අ. පො. ස. (උසස් පෙළ) :

| වර්ෂය | විභාග අංකය | විෂයයන් හා ලබා ඇති සාමාර්ථ |
|---|---|---|
| | | |

(iii) අ.පො.ස. (සාමාන්‍ය පෙළ) :

| පළමුවර :- වර්ෂය : විභාග අංකය : | | දෙවනවර : වර්ෂය : විභාග අංකය : | |
|---|---|---|---|
| විෂයය | ලබා ඇති සාමාර්ථ | විෂයය | ලබා ඇති සාමාර්ථ |
| | | | |

(iv) ඩිප්ලෝමා සහතිකය :

(අ) ලබා ඇති ඩිප්ලෝමාව හා ආයතනය :————.
(ආ) ක්ෂේත්‍රය :————.
(ඇ) වලංගු වන දිනය :————.

(v) සේවා කාලය :————.

(vi) අයදුම් කරන්නේ නිවේදනයේ අංක 3 හි කුමන සුදුසුකම යටතේ ද යන්න (අදාල සහතික පිටපත් අමුණා එවිය යුතුය.) :————.

11. නිවේදනයේ 5 ඡේදයේ IV වගන්තිය යටතේ ග්‍රාම සංවර්ධන නිලධාරී තනතුරකට අනුයුක්තව සේවය කර ඇත්නම් :

සේවා කාලය : අවුරුදු .................. (........................ සිට......................... දක්වා)

12. විභාග ගාස්තු ගෙවූ කුවිතාන්සිය පිළිබඳ විස්තර.-

රිසිට්පත් අංකය :—————.
මුදල් ගෙවූ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නම :—————.

| |
|---|
| මුදල් ගෙවූ කුවිතාන්සිය මෙහි නොගැලවෙන සේ අලවන්න. |

*(කුවිතාන්සියේ ඡායා පිටපතක් ළඟ තබා ගන්න)*

13. *අයදුම්කරුගේ ප්‍රකාශය ඃ*

මෙහි සඳහන් කර ඇති තොරතුරු බඳවා ගැනීමේ නිවේදනයට අනුව මා වෙත ඇති සහතික/ලිපි මත සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. මෙම විභාගය පිළිබඳ කොන්දේසි අනුව, ම විසින් සාවද්‍ය තොරතුරක් දක්වා ඇතොත්, විභාගයට පෙර හෝ පසුව හෝ මගේ විභාග අපේක්ෂකත්වය අවලංගු කල හැකි බවත්, තෝරා ගැනීමෙන් පසුව ඒ බැව් හෙළිවුවහොත් සේවයෙන් පහ කිරීමට යටත් වන බවත් දනිමි. තව ද, විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් හා ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, උතුරු මැද පළාත විසින් පනවනු ලබන නීතිරීතිවලට යටත් වන බව ද ප්‍රකාශ කරමි. තවද මෙම තනතුරට මා තෝරා ගතහොත් පළාත තුළ නියමිත සේවා කාලය සේවය කිරීමට එකඟ වෙමි.

—————,
අයදුම්කරුගේ අත්සන.
(නම ඃ )

දිනය :—————.

14. *දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය ඃ*

මෙම අපේක්ෂකයා/අපේක්ෂිකාව ............................................................................ මයා/මිය/මෙනවියගේ පෞද්ගලික ලිපිගොනුව අනුව ඉහත සඳහන් තොරතුරු නිවැරදි බවත් ........................................................................ කාර්යාලයේ/ආයතනයේ ........................................................ දින සිට ...........................................තනතුරක සේවය කරන බවත්, එම තනතුරේ ස්ථිර කර ඇති බවත්, මෙම තනතුරට අයදුම් කිරීමට ඔහු/ඇය අදාළ නිවේදනයේ 3 ඡේදය අනුව සුදුසුකම් සපුරා ඇති බවත්, නිවේදනයේ 5. IV වගන්තිය යටතේ සුදුසුකම් ලබා ඇති අයෙකු බවත්/නොවන බවත්, ඔහුගේ/ඇයගේ සේවය සතුටුදායක බවත්, මෙම විභාගයේ ප්‍රතිඵල අනුව පත්වීමක් සඳහා තෝරාගනු ලැබුවහොත් ඔහු/ඇය දැනට දරන තනතුරෙන් නිදහස් කළ හැකි බවත්/කළ නොහැකි බවත්, ඉහත සඳහන් කර ඇති තොරතුරු ඔහුගේ/ඇයගේ පෞද්ගලික ලිපිගොනුව අනුව නිවැරදි හා සත්‍ය බවත්, නියමිත විභාග ගාස්තු ගෙවා ඇති බවත්, එම කුවිතාන්සිය අලවා ඇති බවත් ඔහු/ඇය ........................................ වැනි දින මා ඉදිරිපිට දී ඔහුගේ/ඇයගේ අත්සන තැබූ බවත් සහතික කරමි. (අදාළ නොවන වචන කපා හරින්න.)

—————,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන.
(නිල මුද්‍රාව තබන්න.)

දිනය :—————.

සහතික කරන නිලධාරියාගේ සම්පූර්ණ නම :—————.
තනතුර :—————.
ලිපිනය :—————.

—————,
අමාත්‍යාංශ ලේකම්ගේ අත්සන.
(නිල මුද්‍රාව තබන්න.)

දිනය :—————.

සහතික කරන නිලධාරියාගේ සම්පූර්ණ නම :—————.
තනතුර :—————.
ලිපිනය :—————.

06-779

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.